# වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 15 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.361,031 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කිරීමේදී පුස්තකාල පොත් ගිණුම හර කර ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමට බැර කිරීම හේතුවෙන් ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම රු.361,031 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඇඟිලි සළකුනු යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා දරන ලද රු.35,075 ක මුදල ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම රු.35,075 කින් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම රු.35,075 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පත් රු.99,888 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද ණය වාරික වටිනාකම රු.218,569 ක් හා හඳුනා නොගත් තවත් රු.1,053 ක් ප්‍රාග්ධන වැය යටතේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන වැය වටිනාකම රු.219,622 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) 2015 විගණන වාර්තාවේ 2.2.1(අ) නිවැරදි කිරීමේදී ප්‍රාග්ධන වියදම් ණයහිමි ගිණුම රු.50,000 ක් හර කර සමුච්චිත අරමුදල රු.50,000 ක් බැර කළ යුතු වුවත් ප්‍රාග්ධන වියදම් ණය හිමි ගිණුම හර කර, ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.50,000 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල රු.50,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ගබඩා නිකුත් කිරීම්වලට අනුව පොදු ගබඩා වියදම රු.365,984 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.324,708 ක් ලෙස දැක්වීම හේතුවෙන් පොදු ගබඩා වියදම රු.41,276 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.75,686 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන නොසැලසීම හේතුවෙන් වර්ෂයේ ණයහිමි වටිනාකම හා වර්ෂයේ වියදම රු.75,686 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට අදාල පොලිය රු.63,405 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.67,503 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.4,098 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළදී වෙන්දේසියේ විකුණන ලද ලීබඩු උපකරණ අයිතම 09 ක පිරිවැය ගණනය කර ලීබඩු උපකරණ ගිණුමෙන් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාල විදුලි භාණ්ඩ වියදම රු.219,552 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.299,090 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.79,538 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,236,979 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.8,907,987 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු. 7,058,430 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,849,557 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,849,557 ක වර්ධනය කෙරෙහි ආදායම් රු. 7,592,891 කින් වැඩිවීම හා වියදම් රු.5,743,334 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 2,978 | 1,909 | 2,208 |
| (ii) බදු කුලී | 4,234 | 4,185 | 70 |
| (iii) බලපත්‍ර ගාස්තු | 72 | 70 | 02 |

2.2.2 **වරිපනම්**

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.2,011,479 ක් වූ අතර ඉන් රු.1,316,018 ක් හෙවත් සියයට 65 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.1,905,628 න් රු.938,654 ක් හෙවත් සියයට 49 ක් පමණක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.1,632,553 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 58 ක් විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.1,632,553 ක් වූ හිඟ වරිපනම් ආදායම තුළ වසර 01 සිට වසර 03 දක්වා ඒකක 966 කින් රු.448,050 ක්ද, වසර 03 සිට 05 දක්වා ඒකක 1131 කින් රු.705,007 ක මුදලක්ද ඇතුළත් වූ අතර මෙම මුදල් අයකරගැනීමට සභාව විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

2.2.3 **අක්කර බදු**

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ අක්කර බදු ශේෂය රු.74,796 ක් වූ අතර ඉන් 2016 දෙසැම්බර් 31 වන විට රු.17,225 ක් එනම් සියයට 23 ක් පමණක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ බිල් කිරීම රු.14,822 ක් වූ අතර ඉන් රු.5,502 ක් එනම් සියයට 37 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.4 **වෙනත් ආදායම්**

(අ) **ව්‍යාපාර බදු**

(i) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.267,450 ක් වූ අතර වර්ෂය තුළ ඉන් රු.165,270 ක් එනම් සියයට 62 ක් පමණක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ බිල් කිරීම රු.775,440 ක් වූ අතර ඉන් රු.461,010 ක් එනම් සියයට 59 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂයන්ට අදාලව හිඟ ව්‍යාපාර බදු ආදායම බදුකරුවන් 323 දෙනෙකුගෙන් රු.416,610 ක් වූ අතර මෙම බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>කර්මාන්ත බදු</u>

(i) 2015 වර්ෂය තුළදී අය කර නොගත් කර්මාන්ත බදු ආදායම රු.154,460 ක් වූ අතර එම බදුකරුවන්ගෙන් වර්ෂය තුළදී එකතු කර තිබුණේ රු.112,750 ක් හෙවත් සියයට 73 ක් පමණි.

(ii) ප්‍රවර්තන වර්ෂයේ කර්මාන්ත බදු බිල් කිරීම් රු.175,950 ක් වූ අතර ඉන් රු.126,000 ක් හෙවත් සියයට 71 ක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන වර්ෂයට අදාල කර්මාන්ත බදු ආදායමද වර්ෂය තුළ එකතු කරගැනීමට නොහැකි වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂයට අදාල කර්මාන්ත බදු ආදායමින් සමාලෝචිත වර්ෂය අවසානයට බදුකරුවන් 75 දෙනෙකුගෙන් රු.91,660 ක් හිඟව පැවති අතර එම හිඟ ශේෂය අයකිරීමට නඩු පැවරීමක්ද සිදු කර නොතිබුණි.

(ඇ) <u>මස් වෙළඳසැල් ආදායම</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට මස් වෙළඳසැල් ආදායම රු.56,636 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් කිසිදු මුදලක් එකතු කර නොතිබුණි.

(ඇ) <u>පොදු වෙළඳපොල කඩකාමර බදු</u>

2010 වසරට පෙර සිට බදු දී ඇති පොදු වෙළඳපොල කඩ කාමර 06 එකම බදුකරුවන් වෙත වසර ගණනාවක සිට බදු දී තිබුණි. එම කඩකාමර 06 සඳහා සමහර වර්ෂවල ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර මාසික බදු මුදල්ද අයකිරිමක් කර නොතිබූ අවස්ථා විය.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 8,209,907 |
| (ii) | මුද්දර ගාස්තු | 2,779,375 |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) <u>බැංකු සැසඳුම්</u>

(i) මහජන බැංකු ගිණුම් අංක 261-001-9-0000001 ට අදාල 2016 දෙසැම්බර් 31 ට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව උපලබ්ධි නොවූ චෙක්පත් හා මුදල් ලෙස රු.4,845,273 ක් දක්වා තිබුණු අතර, එම ශේෂය තුළ 2010, 2011, 2012, 2013, 2014, 2015, හා 2016 වර්ෂවලට අදාලව පිළිවෙලින් රු.6,255 ක්, රු.1,421 ක්, 230,000 ක්, 2,856 ක්, රු.10,000 ක්, රු.39,400 ක් හා රු.4,555,346 ක් පැවති අතර එම ශේෂ පිළිබඳව බැංකුවෙන් විමසා පසු විපරම් කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් ලෙස රු.4,549,340 ක් දක්වා ඇතත් එම මුදලට අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) මහජන බැංකු ගිණුම් අංක 261-001-9-0000044 ට අදාලව 2012 වර්ෂයේ සිට පැවත එන රු.836,245 ක් වූ ගිණුම් ශේෂ 11 ක් 2017 ජූනි 20 දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබීම</u>

(i) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව සභාව සතු වාහන 38 ක් පැවති අතර ඉන් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් නොවූ වාහන 11 ක් විය.

(ii) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන්ව තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛනවල සටහන් නොවූ වාහන 06 ක් තිබුණි.

(ඇ) **<u>ගබඩා ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබීම</u>**

පොදු ගබඩා තොග පොත්වල ආරම්භක ශේෂ, වර්ෂය තුළ මිලට ගැනීම්, නිකුත් කිරීම් නිසි පරිදි සටහන් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.412,900 ක් වූ පොදු ගබඩා ශේෂය පරීක්ෂා කළ නොහැකි විය.

(ඈ) **<u>අය නොවන සේවක ණය</u>**

2016 දෙසැම්බර් 31 දිනට අය නොවන සේවක ණය ශේෂය රු.50,701 ක් වූ අතර එය 2008 වර්ෂයේ සිට පැවත එන රු.24,850 ක් වූ වැඩ තහනම් කළ සේවක ණය ශේෂයකින්, 2012 වර්ෂයේ සිට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.17,101 ක ශේෂයකින් හා 2014 වර්ෂයේ සිට සේවය හැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.8,750 ක ශේෂයකින් සමන්විත විය. එම ණය ශේෂ අයකරගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) **<u>දැන්වීම් පුවරු ආදායම්</u>**

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂයේ ආදායම් අය කිරීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු නොකිරීම නිසා සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරු 33 කින් ලැබිය යුතු බලපත්‍ර ආදායම අහිමි වී තිබුණි.

(ඊ) **<u>ඉඩම් ලේඛන/ හිමිකම් ඔප්පු</u>**

හිමිකම් ඔප්පුවලට අදාල ඉඩම්, ඉඩම් ලේඛනයේ ඇතුළත් නොවූ අවස්ථා හා එකී ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

(උ) **<u>වාහන පාලනය</u>**

(i) ධාවන තත්ත්වයේ ට්‍රැක්ටර් රථ 04 ක් සඳහා සේවයේ නියුක්තව සිටියේ රියදුරන් දෙදෙනෙක් පමණක් වූ අතර වසර 1 ½ කට වැඩි කාලයක සිට ධාවනය කළ හැකි වාහන 02 ක් ධාවනයට යොදාගෙන නොතිබුණි.

(ii) පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2015 පෙබරවාරි 20 දින ලැබී තිබූ කම්පැක්ටර් රථයක් ලැබූ දින සිටම භාවිතයට ගෙන නොතිබුණි.

(iii) සුළු අළුත්වැඩියාවකින් පසු ප්‍රයෝජනයට ගත හැකි වාහන 04 ක් වසර 2 කට වැඩි කාලයක් අක්‍රියව පැවති අතර වසර 2 කට වැඩි කාලයක් අක්‍රියව ඇති වාහන 03 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) දිගු කාලයක සිට අක්‍රිය මට්ටමේ පවතින අංක රහිත ට්‍රේලරය හා අබලි මට්ටමේ පවතින කැබ් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) වසර 5 ක පමණ කාලයක සිට භාවිතයට නොගත් අංක රහිත ට්‍රේලරයක් අළුත්වැඩියා කර ඇතත් අළුත්වැඩියාවෙන් පසුව භාවිතයට ගෙන නොතිබුණි.

## 3.2 <u>කොන්ත්‍රාත් පාලනය</u>

### (අ) <u>මාළඹේ බටකැලේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩාපිටිය සැකසීමේ ව්‍යාපෘතිය</u>

2014 වර්ෂයේ ගම නැගුම වැඩසටහන යටතේ මාළඹේ බටකැලේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩාපිටිය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා රු.882,000 ක මුදලක් අදාල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 03 ට පටහැනිව හුඹස් මැටි වෙනුවට සාමාන්‍ය පස් දමා හුඹස් මැටි කියුබ් 12.25 කට අදාල මුදල වන කියුබ් එකකට රු.6,500 බැගින් රු.79,625 ක් ගෙවා තිබුණි.

(ii) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 05 ට අනුව සිනිඳු වැලි සහ හුඹස් මැටි යෙදීම වෙනුවට එම ස්ථානයෙන් කපන ලද පස් යොදා තිබූ අතර කියුබ් 10.90 ක් සඳහා රු.73,575 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) වොලිබෝල් දැලක් සපයා සවි කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 08 ට අනුව රු.4,500 ක් ගෙවීම් කර තිබුණද වොලිබෝල් දැලක් සපයා නොතිබුණි.

(iv) ඇස්තමේන්තු සකස් කර තිබුණද මෙම ක්‍රීඩා පිටිය සඳහා විදුලිය සපයා නොතිබුණු අතර රු.138,000 ක් ගෙවා සවි කරන ලද හැලජන් ලාම්පුද ක්‍රියා විරහිත තත්ත්වයට පත්ව තිබුණි.

(v) ක්‍රීඩා පිටිය නිසි ප්‍රමිතියකින් ඉදි කර නොතිබීම හා ක්‍රීඩා පිටියට ලඟාවීමේ දුෂ්කරතාවය නිසා දරන ලද රු.882,000 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි

(ආ) <u>ඉත්තෑපාන ආදාහනාගාරය ඉදිකිරීම</u>

2014 පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ ඉත්තෑපාන ආදාහනාගාරයේ අදියර I ඉදිකිරීම රු.8,116,883 ක (වැට් රහිත) ඇස්තමේන්තුවක් මත 2014 ඔක්තෝබර් 30 දින බාහිර පාර්ශවයකට පවරා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව එකී කොන්ත්‍රාත්තුව ගිවිසුමේ දින සිට මාස දෙකක් ඇතුළත නිම කළ යුතු වුවත් 2016 නොවැම්බර් 18 දින වන විටත් එකී ඉදිකිරීම් නිම නොකිරීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.34,300 ක මුදලක් අයකර තිබුණි. ඉදිකිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොතිබූ අතර පසුව පරිසර අධිකාරිය විසින් එකී ඉදිකිරීම යෝග්‍ය නොවන බැවින් වෙනත් ස්ථානයක ස්ථාපිත කරන ලෙස දන්වා තිබුණද එකී නිර්දේශයන්ට පටහැනිව ඉදිකිරීම් අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.

## 3.3 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභාව විසින් දිරන කසළ කළමනාකරණය වෙනුවෙන් කොම්පෝස්ට් අංගනයක් පවත්වාගෙන ගියද පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි.

(ii) කසළ කළමනාකරණය වෙනුවෙන් වැය වන පිරිවැය ආවරණය කරගැනීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

(iii) කසළ බැහැර කිරීම සඳහා ඇති භූමියට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(iv) කසළ වෙන් කර එකතු කරන වැඩපිළිවෙලක් නොතිබූ අතර අංගනයේ අපද්‍රව්‍ය වලින් වෙන් කර ගනු ලබන යකඩ/ ප්ලාස්ටික් /කඩදාසි වැනි සම්පත් අලෙවියෙන් ලැබෙන ආදායම් සභාවට ලැබී නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය

(ඈ) අයවැයකරණය

(ඉ) වාහන පාලනය